# සංක්ෂිප්තය


මෙම පර්යේෂණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ විදුහල්පතිවරුන් විසින් ගුරුවරුන්ගේ සේවා තෘප්තිය වැඩි දියුණු කිරීමට යොදා ගන්නා පෙළඹවීම් ක්‍රමෝපායන් මොනවාද යන්න විමර්ශනය කිරීමයි. විදුහල්පතිවරුන්ට තම ගුරු මණ්ඩලය සම්බන්ධව කටයුතු කිරීමේ දී ගුරු මණ්ඩලය වඩාත් ප්‍රශස්ත මට්ටමින් ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය සඳහා පෙළඹවීම් උදෙසා ගුරු සේවා තෘප්තිය සම්බන්ධ වැදගත් වන්නා වූ සාධක හඳුනා ගැනීමට මෙමගින් හැකිවේ. මේ නිසා ගුරු භූමිකාවෙන් ඉටුවිය යුතු කාර්යයන් තවදුරටත් සාර්ථකව ඉටුකර ගැනීමට පිටු බලයක් ලැබේ. එසේම ගුරුවරුන්ගේ සේවා තෘප්තිය සම්බන්ධයෙන් විවිධ වර්ගයේ පාසල් අනුගමනය කරන්නා වූ ක්‍රමෝපායන් හඳුනා ගැනීමටත් ගුරු සේවා තෘප්තිය වර්ධනය කිරීමේදී ගුරුවරුන් හා ගුරුවරියන් සඳහා කවරාකාරයේ සාධක වඩාත් යෝග්‍යවේදැයි හඳුනා ගැනීමටත් මෙමගින් අවකාශ ලැබේ. එමෙන්ම පෙළඹවීම් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රායෝගිකව විදුහල්පතිවරුන් මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීමටත් ඒ අනුව කටයුතු කිරීමට හා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම් වලදීත් මෙමගින් මතු කොට ඇති අනාවරණ ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම පර්යේෂණය ප්‍රධාන අරමුණු පහක් මත ගොඩනඟන ලදී. පාසල්වල ගුරුසේවා තෘප්තිය වැඩි දියුණු වීමට ඉවහල්වන සාධක හා නිර්ණායක වල ක්‍රියාත්මක මට්ටම විමසීම. පාසල් වර්ගය අනුව ගුරු සේවා තෘප්තිය සඳහා බලපාන සාධක වල වෙනස්කම් පවතී දැයි විමසා බැලීම. විදුහල්පතිවරුන්ගේ ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ගුරුසේවා තෘප්තිය සඳහා බලපාන සාධක වල වෙනස්කම් පවතීදැයි විමසා බැලීම, ගුරුවරුන්ගේ ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගුරුසේවා තෘප්තිය සඳහා බලපාන සාධක වල වෙනස්කම් පවතී දැයි විමසා බැලීම සහ ගුරු සේවා තෘප්තිය වැඩි දියුණු කිරීමේ දී විදුහල්පතිවරු මුහුණ දෙන ගැටලු හා අභියෝග මොනවාදැයි විමසා බැලීම එම අරමුණ වේ.

ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ රජයේ සිංහල මාධ්‍ය පාසල් 12 ක් හා එම පාසල් වල විදුහල්පතිවරු 12 දෙනාත්, ගුරුවරුන් 144 දෙනෙක් ද ස්ථරගත නියැදි ක්‍රමයට තෝරා ගන්නා ලදී. දත්ත එකතු කිරීම සඳහා විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ යොදා ගැනිණ. ලබාගත් දත්ත සංඛ්‍යා හා ප්‍රතිශත වගු ප්‍රමුඛතා තේරීම මගින් විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව, සමස්ත වශයෙන් ගත් කළ ගුරු සේවා තෘප්තිය වැඩි දියුණු වීමට ඉවහල්වන සාධක හා නිර්ණායක වල ක්‍රියාත්මක මට්ටම සතුටුදායක නොවන බව අනාවරණය විය. ගුරුවරුන්ගේ සේවා තෘප්තිය ඉහළ නැංවීමට විවිධ වැඩ සටහන් ඉහළ මට්ටමකින් ක්‍රියාත්මක කරන බව විදුහල්පතිවරුන් ප්‍රකාශ කොට තිබුණද ගුරු ප්‍රශ්නාවලිය හා නිරීක්ෂණ මගින් එසේ නොවන බව අනාවරණය විය. විශේෂයෙන් ගුරුභවතුන් පිළිගැනීමට ලක් කිරීම, ගුරු වැටුප් ලබාදීම සම්බන්ධව විදුහල්පතිගේ කටයුතු, යහපත් වාතාවරණයක් හා පහසුකම් සැපයීම සම්බන්ධව විදුහල්පතිවරුන් තරමක සතුටුදායක මට්ටමකින් කටයුතු කර ඇති බව අනාවරණය විය. එසේ වුවත් ගුරුවරුන්ගේ ගුරුවෘත්තීමය සාධනයට/ ජයග්‍රහණයට අවස්ථාව ලබාදීම, වගකීම් පැවරීමට හා තීරණ ගැනීමට සහභාගි කර ගැනීම, සංවර්ධනයට ඇති අවස්ථා අධීක්ෂණය සම්බන්ධව විදුහල්පතිගේ කටයුතු, සුභසාධන සේවා හා වෙනත් ප්‍රතිලාභ, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම සඳහා ඉඩකඩ ලබාදීම, යහපත් සන්නිවේදන ක්‍රමවේදයක් ඇති කිරීම යන සාධක සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ගේ කටයුතු සතුටුදායක මට්ටමකින් ක්‍රියාත්මක නොවූ බව අනාවරණය විය.

ගුරුවරුන් පිළිගැනීමට ලක් කිරීම, වගකීම් පැවරීම හා තීරණ ගැනීමට සම්බන්ධ කර ගැනීම, සුභසාධන සේවා හා වෙනත් ප්‍රතිලාභ ලබා දීම, යහපත් වාතාවරණයක් හා පහසුකම් සැපයීම, යහපත් සන්නිවේදන ක්‍රම ක්‍රියාත්මක කිරීම යන සාධක වලට අදාළ කටයුතු 1AB පාසල්වල ඉහළ මට්ටමක විය. අධීක්ෂණය සම්බන්ධව විදුහල්පතිගේ කටයුතු, ගුරු වැටුප් ලබාදීම සම්බන්ධ විදුහල්පතිගේ කටයුතු 1AB හා 1C පාසල් වලට වඩා 2 හා 3 වර්ගයේ පාසල්වල ඉහළ මට්ටමක ක්‍රියාත්මක වූ බවම අනාවරණය විය. එසේම අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම සඳහා වැඩි ඉඩකඩක් ලබා දීමට විදුහල්පතිවරුන් කටයුතු කර ඇති බව 3 වර්ගයේ පාසල් වලින් අනාවරණය විය. ගුරු භවතුන් පිළි ගැනීමට ලක් කිරීම විදුහල්පතිවරුන් අතින් ඉහළින් සිදුවන බවත්, ගුරුවරුන්ට වෘත්තීමය සාධනයට හා ජයග්‍රහණයට අවස්ථාව ලබාදීම, වගකීම් පැවරීමට හා තීරණ ගැනීමට සහභාගි කර ගැනීම, අභ්‍යන්තර අධීක්ෂණය සම්බන්ධ කටයුතු හා අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම සඳහා ඉඩකඩ ලබාදීමට කටයුතු කිරීම ආදී සාධක හා ඊට අයත් කාර්යය විදුහල්පතිවරුන්ට වඩා විදුහල්පතිනියන් අතින් ඉටු වන බව අනාවරණය විය. ගුරු සේවා තෘප්තිය සඳහා ඉවහල් වන සාධක පිළිබඳ ගුරු වරුන්ගේ ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව වැඩි වෙනසක් නොමැති බව නිගමනය කළ හැකිය. ගුරුවරුන්ගේ සේවා තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා විවිධ ව්‍යාපෘති, වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය නීතිරීති හා රෙගුලාසි වලින් සිදුවන බාධා ප්‍රමුඛ වන බව විදුහල්පතිවරුන්ගෙන් වැඩිම පිරිස ප්‍රතිචාර දක්වා තිබිණ.